**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**
**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**
**නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම**
**අවසාන පරීක්ෂණය - 2020/2021 (විවෘත ග්‍රන්ථ පරීක්ෂණය)**
**LLU5712/LWU3315 පොදු අන්තර්ජාතික නීතිය**
**කාලය - පැය (03) තුනයි**

**දිනය: 2021 සැප්තැම්බර් 11** **වේලාව: පෙ.ව. 9.30 - ප.ව.12.30**

---

**මුළු ප්‍රශ්න ගණන 05 යි.**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

**අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

1. " පසුගිය දශක කිහිපය තුළ සිදු වූ අතිශය වැදගත් වෙනස්කමක් වන්නේ යටත් විජිතකරණ ක්‍රියාවලිය හා අදාළ මහා රැල්ල හමුවේ ජාතික රාජ්‍යන්ගෙන් සමන්විත අන්තර්ජාතික සමාජය විශාල ලෙසින් තිරස් ආකාරයෙන් ව්‍යාප්ත විමයි. තවත් ප්‍රධාන වර්ධනයක් වන්නේ රාජ්‍යයන්ගේ සහයෝගිතාවය සඳහා ස්ථිර ආයතන වශයෙන් අන්තර්ජාතික සංවිධානවල සිදු වූ පුදුමාකාර වර්ධනයයි. තුන්වන වැදගත් වෙනස වන්නේ වර්තමානය වන විට අන්තර්ජාතික නීතිය නම් විෂය පථය තුළ හුදෙක් ජාතික යුධ ගැටුම් වැළැක්විම වෙනුවට මානව සුභසිද්ධිය ප්‍රවර්ධනය සඳහා බලපාන නොයෙකුත් වැදගත් මාතෘකා පිළිබඳව සක්‍රියව අවධානය යොමු කරමින් සිටිමයි. "

   **DR P.R'.Menon , *'The Legal Personality of International Organizations "* (1992 ) 4 Sri Lanka J Int' I L 79**

   ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද?

   අන්තර්ජාතික නෛතික පුද්ගලභාවයට ඇති තත්කාලින අභියෝග ඇසුරෙන් ඉහත ප්‍රකාශයේ නෛතික වලංගුභාවය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.
   අධිකරණ තීරණ සහ නීති අධිකාරින් ඇසුරෙන් ඔබගේ පිළිතුර තහවුරු කරන්න.

   **(ලකුණු 25)**

2. ලිකිස්ටාන් සහ ටජිස්ටාන් යනු අසල්වැසි රාජ්‍යයන් දෙකකි. ටජිස්ටාන් රාජ්‍යය විසින් සිදු කළ නාවික අවහිර කිරීම්වලට ප්‍රතිචාරයක් ලෙස ලිකිස්ටාන් රාජ්‍යය, ටජිස්ටාන් රාජ්‍යයට විරුද්ධව යුධ ප්‍රකාශ කළේය. එසේම, ලිකිස්ටානයේ මිලිටරි හමුදාවන්ට ටජිස්ටානයේ උතුරු පළාතේ සමහර ප්‍රදේශ අත්පත් කර ගත හැකි වූ අතර සිවිල් වැසියන් සමූල ඝාතනය කිරීම් සහ සිවිල් වැසියන් විශාල සංඛ්‍යාවක් බලහත්කාරයෙන් සේවයේ යෙද වීම සඳහා පිටුවහල් කිරීම ඇතුළු එම ප්‍රදේශයේ ජනගහනයට එරෙහිව බොහෝ සාහසික ක්‍රියා සිදු කළහ. තවද, ඔවුන් විසින් සිවිල් වැසියන්ගේ නිවෙස් ඉදිරිපිට දී ඔවුන්ට පහර දී ඔවුන්ගේ දේපළ ද කඩා බිඳ දමා ඇත.

මාස කිහිපයකින් අනතුරුව, ලිකිස්ටාන් සහ ටජිස්ටාන් අතර ගිවිසුමක් ඇති වූ අතර “ ඇතැම් දේපළ ආශ්‍රිත ආර්ථික ගැටලු සමථ කර ගැනීම ” පිළිබඳව එහි සඳහන් විය. පහත සඳහන් වන්නේ එම ගිවිසුමේ කොටසකි.

1 වගන්තිය - ලිකිස්ටාන් රජය විසින් ටජිස්ටාන් වෙත ‘ආර්ථිකමය ස්වභාවයක් ගන්නා කැපී පෙනෙන ගැටලු’ සඳහා වන්දි ගෙවිය යුතුය.

**2** වගන්තිය - ඉහත සඳහන් කළ ඉල්ලීම් සම්බන්ධයෙන් ගෙන ආ හැකි ඕනෑම අධිකරණ හෝ වෙනත් යම් නෛතික ක්‍රියාදාමයක් සම්බන්ධයෙන් ටජිස්ටානයේ ස්වභාවික හෝ නෛතික පුද්ගලයන්ට අලාභ ලබා දීම ලිකිස්ටාන් රජය විසින් සිදු කළ යුතුය.

මේ අතරතුරේ දී, අත්අඩංගුවේ තබා ගෙන පසුව ලිකිස්ටාන් වෙත පිටුවහල් කළ ටජිස්ටාන් ජාතික ෆෙරි මහතාව යුධ කටයුතු අවසන් වන තෙක්ම එහි රඳවා බලහත්කාරයෙන් යුධ අවි කර්මාන්තශාලාවක සේවයේ යොදවා තිබුණු අතර පසුව එම ක්‍රියාවලට එරෙහිව ටජිස්ටාන් අධිකරණයක ලිකිස්ටාන් රාජ්‍යයට එරෙහිව නඩු පවරා තිබිණි. අධිකරණය කියා සිටියේ පැමිණිලි කරන ලද ක්‍රියාවන් අන්තර්ජාතික අපරාධ වන නිසා එවැනි අවස්ථාවලදී රාජ්‍යය විනිර්මුක්තිය අදාළ නොවේ යන පදනම මත ලිකිස්ටාන් රාජ්‍යයට එරෙහිව ෆෙරි මහතා ගෙන ආ වන්දි නඩු සම්බන්ධව ටජිස්ටාන් හි අධිකරණයට අධිකරණ බලය ඇති බවයි. තවද, සමූල ඝාතනයට ලක් වූ වින්දිතයන්ගේ ඥාතීන් සිදු වූ ජීවිත හා දේපළ හානි සම්බන්ධයෙන් වන්දි ලබා ගැනීමට ලිකිස්ටාන් රාජ්‍යයට විරුද්ධව ටජිස්ටාන් අධිකරණයක නඩු කටයුතු ආරම්භ කර ඇත.

අන්තර්ජාතික නීතිය යටතේ ඉහත සිදුවීම හා බැඳුණු නෛතික ගැටලු සාකච්ඡා කරන්න.

**(ලකුණු 25)**

3. අසල්වාසී රටවල් වන ඉන්දියානෝ සහ ලන්කානෝ අතර Rio Bay නම් වූ සමුද්‍ර සන්ධියක් ඇත. සුපිරියානෝ රාජ්‍යය වෙත ඩීසල් අපනයනය කිරීමට ඉන්දියානෝ තීරණය කළ අතර ඩීසල් තෙල් ටොන් 270,000 ක් අලෙවි කිරීම සඳහා සුපිරියානෝ සමඟ ගිවිසුමක් අත්සන් කළේය. ඉන්දියානෝ හි ලියාපදිංචි "නිව් සැන්ටා" නම් නෞකාව මගින් ඇනවුම් කරන ලද ඩීසල් තෙල් සුපිරියානෝ වෙත බාර දීමට සැලසුම් කර තිබුණි. ඉන්දියානෝ සිට සුපිරියානෝ වෙත ගමන් කරමින් තිබියදී ලංකානෝ හි භෞමික මුහුදු සීමාව ආසන්නයේ Rio Bay සමුද්‍ර සන්ධිය හරහා ගමන් කරමින් සිටින අතර තුර දී හටගත් ගින්නක් හේතුවෙන් "නිව් සැන්ටා" නෞකාව අර්ධ වශයෙන් පුපුරා යාමකට ලක් විය. අනතුරෙන් පසු වහාම ලංකානෝ හි නැව් සහ හෙලිකොප්ටර් යානා ගිනි නිවීම සඳහා සහය වූහ. ගින්න පැතිරීම පාලනය කර මුල් අවස්ථාවේදී නෞකාව බේරා ගැනීමට ලංකානෝ හි ගිනි නිවීමේ කණ්ඩායම සමත් විය. ඉතිරි වූ ඩීසල් තෙල් Rio Bay සමුද්‍ර සන්ධියෙන් ප්‍රවාහනය කිරීමට ඉන්දියානෝ එකඟ විය. කෙසේ වෙතත් ගින්නෙහි මුල් අවස්ථාවේ ප්‍රතිඵලයක් ලෙස ලංකානෝ හි මුහුදු පරිසරයට රසායනික ද්‍රව්‍ය ටොන් 1700 ක් කාන්දු වී ඇත. තවද, අවදානම පාලනය කර ගැනීමේ උත්සාහයන් සඳහා සැලකිය යුතු මූල්‍ය පාඩුවක් දැරීමට ලංකානෝ රාජ්‍යයට සිදු වී ඇත.

ගින්න පිළිබඳ කරන ලද පරීක්ෂණය පදනම් කරගත් මූලික වාර්තාවට අනුව ගින්න ඇති වීමට හේතු වී ඇත්තේ නිව් සැන්ටා නෞකාවෙහි තත්ත්වය පිළිබඳ ප්‍රමාණවත් ලෙස පරීක්ෂා කර නොතිබීමයි. නිව් සැන්ටා ව්‍යවසනයේ බලපෑම සම්බන්ධයෙන් ඉන්දියානෝ රජය වගකිව යුතු බව ලංකානෝ ප්‍රකාශ කළේය. කෙසේ වෙතත් ඉන්දියානෝ නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශ කර සිටියේ "නිව් සැන්ටා" හි අයිතිය පුද්ගලික සමාගමක් වන "Aqua නැව් සමාගම් සමූහයට" අයත් බවත් ගින්න සහ එහි බලපෑම සඳහා ඔවුන් වග නොකියන බවත්ය. නිල වාර්තාවන්ට අනුව "Aqua නැව් සමාගම් සමූහයේ 65% ක කොටස් ඉන්දියානෝ සතු වන අතර එහි ව්‍යාපාරික කටයුතු පාලනය කෙරෙන්නේ ඉන්දියානෝ විසිනි.

ලංකානෝට සිදු වූ හානිය සම්බන්ධයෙන් ඉන්දියානෝ වගකීමට ලක්කල හැකිද යන්න පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් මේ සිද්ධියට අදාල නෛතික කරුණු සාකච්ඡා කරන්න.

අදාල අධිකාරින් සමඟ ඔබගේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 25)

4. ප්‍රජාතන්ත්‍රවාදි සමාජවාදි ජනරජයක් වන සුපිරියානෝ රාජ්‍යය ජාත්‍යන්තර නීතිය පිලිගන්නා අතර එහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ජාත්‍යන්තර ගිවිසුම් බැඳීම් පවත්වා ගෙන යනු ලබයි. සියළුම කාන්තා විශ්ව විද්‍යාල සේවකයින්ගේ වැටුප 1.85% කින් අඩු කරන නීතියක් සුපිරියානෝ පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීමට නියමිතව ඇත. යෝජිත නීතිය සුපිරියානෝ හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ජාත්‍යන්තර බැඳීම් උල්ලංඝනය කරන බැවින් එය ක්‍රියාත්මක කළ නොහැකි බව සුපිරියානෝ රාජ්‍ය වෛද්‍ය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනඥයෙකු සහ වෛද්‍යවරයෙකු ලෙස සේවය කරන රමෝනා මහත්මිය පවසයි. ඇයගේ සොයා ගැනීම්වලට අනුව යෝජිත නීතිය ක්‍රියාත්මක කිරීමට යාමේදි පහත සඳහන් ජාත්‍යන්තර සම්මුතීන් හි ප්‍රතිපාදන උල්ලංඝනය වනු ඇතැයි ඇය විශ්වාස කරයි.

- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ (ICCPR) **26** වගන්තිය.

  නීතිය ඉදිරියේ සියලු පුද්ගලයින් සමාන වන අතර කිසිදු වෙනස්කමක් කිරීමකින් තොරව නීතියේ සමාන ආරක්ෂාව සඳහා හිමිකම් ඇත. මේ සම්බන්ධයෙන් ගත් කල, ජාතිය, වර්ණය, ස්ත්‍රී පුරුෂ භාවය ,භාෂාව, ආගම, දේශපාලන හෝ වෙනත් මතයක් , ජාතික හෝ සමාජීය සම්භවය, දේපළ, උපත හෝ වෙනත් තත්ත්වයන් මත පදනම් කර ගෙන ඕනෑම ආකාරයේ වෙනස් කොට සැලකීම් නීතියෙන් තහනම් වන අතර සමාන හා ඵලදායි ආරක්ෂාවක් සියළුම පුද්ගලයන් සම්බන්ධයෙන් තහවුරු කළ යුතුය.

- ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ (ICESCR) **7** අ (i) වගන්තිය

  සාධාරණ වැටුප් සහ කිසිම ආකාරයක විශේෂත්වයන් හෝ වෙනස්කමක් නොමැතිව සමාන වටිනාකමෙන් යුත් වැඩ සඳහා සමාන පාරිශ්‍රමිකයන්, විශේෂයෙන්ම ස්ත්‍රීන්ට, සමාන වැඩ සඳහා සමාන ගෙවීම සහිතව පුරුෂයන් විසින් භුක්ති විඳින සේවා තත්ත්වයන්ට වඩා පහත් නොවන සේවා තත්ත්වයන් සහතික කළ යුතුය.

- කාන්තාවන්ට එරෙහිව සියළුම ආකාරයේ වෙනස් කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතියේ **3** වන වගන්තිය ( CEDAW)

  පාර්ශවකාර රාජ්‍යයන් සියළු ක්ෂේත්‍රවල විශේෂයෙන් දේශපාලන, සමාජයීය, ආර්ථික සහ සංස්කෘතික ක්ෂේත්‍රවල, පුරුෂයන් හා සාමානාත්මතාව මත පදනම්ව මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස පරිහරණය හා භුක්ති විඳීම තහවුරු කරනු වස් ස්ත්‍රීන්ගේ පූර්ණ සංවර්ධනය සහ ප්‍රගමනය සහතික කරනු පිණිස ව්‍යවස්ථා සම්පාදනය ඇතුළුව සියලු පියවර ගනු ඇත.

ඔබ සුපිරියානෝ රාජ්‍යයේ නීති විද්‍යාලයට අනුබද්ධව පොදු අන්තර්ජාතික නීතිය සම්බන්ධව කටයුතු කරන අධ්‍යාපනඥයෙකු යැයි සලකන්න. සිය තර්කයට සහය දැක්වීම සඳහා ඉහත සඳහන් කල අන්තර්ජාතික සම්මුති ප්‍රතිපාදන දේශිය අධිකරණයන් තුළ අදාළ කර ගැනිම සම්බන්ධයෙන් රමෝනා මහත්මිය ඔබේ උපදෙස් පතයි.

සුපිරියානෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ එහි අන්තර්ජාතික බැඳීම් ශ්‍රී ලංකාවට සමාන යැයි උපකල්පනය කරන්න. ජාත්‍යන්තර නීති රාමුවල අදාළ ප්‍රතිපාදන, අධිකරණ තීන්දු සහ සමකාලින උදාහරණ ඔබගේ උපදෙස් තුල අන්තර්ගත විය යුතු වේ.

**(ලකුණු 25)**

5. මාගරිටා සහ ජෙම්මා යනු අසල්වැසි රාජ්‍යයන් වන අතර එම රාජ්‍යයන් දෙකෙහි මායිමේ පිහිටි “Temple Thimora” නමින් හැඳින්වෙන ආගමික ස්මාරකයක හිමිකාරිත්වය පිළිබඳව වසර **20** ක පමණ සිට නොවිසුඳුන ආරවුලක් පවති. ඓතිහාසික හිමිකම් මත පදනම්ව මාගරිටා සහ ජෙම්මා රාජ්‍යයන් දෙකම “Temple Thimora” හි අයිතිය ඉල්ලා සිටිති. කෙසේ වෙතත්, මෙම ආගමික ස්ථානය දැනට ජෙම්මා රාජ්‍යයේ පාලනය යටතේ පවතී. මෙකී රාජ්‍යයන් දෙකම එක හා සමානව බලවත් වන අතර එක්සත් ජාතීන්ගේ සාමාජිකයන් ද වේ.
මාගරිටා රාජ්‍යය මෑතකදී නිල නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේ ජෙම්මා රාජ්‍යය “Tempie Thimora” හි අයිතිය භාර නුදුනහොත් ජෙම්මා රාජ්‍යයේ ආගමික හා සංස්කෘතික ස්මාරක වලට බෝම්බ හෙළන බවයි. පුවත්පත් නිවේදනයෙන් සතියකට පසු ජෙම්මා හි අලුත් අවුරුදු දිනයේදි එහි ආගමික හා සංස්කෘතික ස්මාරක කිහිපයකට බෝම්බ ප්‍රහාර එල්ල විය. එහි ප්‍රතිඵලයක් ලෙස ගොඩනැගිලි කිහිපයක් විනාශ වූ අතර සිවිල් වැසියන් **157** ක් මිය ගියහ. මාගරිටා විසින් බෝම්බ ප්‍රහාර එල්ල කිරීම, එක්සත් ජාතීන්ගේ සාමාජික රටක් ලෙස ජාත්‍යන්තර බැඳීම් දැඩි ලෙස උල්ලංඝනය කිරීමක් බවත් මෙකී ප්‍රහාරයේ නීති විරෝධි භාවය පිළිබඳව ජාත්‍යන්තර ප්‍රජාව බරපතල ලෙස ප්‍රතිචාර දැක්විය යුතු බවත් ජෙම්මා රාජ්‍යයේ ජනාධිපති නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේය. ලබන මාසයේ දී සැමරීමට නියමිතව ඇති ඔවුන්ගේ නිදහස් දිනයේදි මාගරිටා රාජ්‍යය විසින් තවත් ප්‍රහාරයක් එල්ල කරනු ඇතැයි ජෙම්මා රාජ්‍යය අපේක්ෂාවෙන් සිටී.

ඉහත තත්ත්වය සම්බන්ධයෙන් ජෙම්මා රාජ්‍යයට උපදෙස් දෙන්න.

අදාළ නීති අධිකාරින් මගින් ඔබගේ පිළිතුර තහවුරු කරන්න.

**(ලකුණු 25)**

**හිමිකම් ඇවිරිණි**